# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| දිනය Date | 2026.02.15 පැය 0430 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/280/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

## 2026 T - 20 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියට අදාල ඉන්දු - පකිස්ථාන තරගය සම්බන්ධව.

2026 T 20 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේ ඉන්දු - පකිස්ථාන තරගය සඳහා අවශ්‍ය ආරක්ෂක වැඩ සටහන මේ වන විට සූදානම් කර තිබේ. මෙහිදී මහජනතාවගේ ආරක්ෂාව, රථවාහන පාලනය, රථවාහන ගාල් කිරීම, විකල්ප මාර්ග හඳුන්වාදීම ආදි සියලු කරුණු කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන ඇත. නරඹන්නන්ගේ පහසුව සඳහා අවශ්‍ය සියලුම සැලසුම් මේ වන විට ක්‍රියාත්මක කර තිබේ.

ශ්‍රී ලංකා පොලිසිය, පොලිස් විශේෂ කාර්ය බලකාය, ත්‍රිවිධ හමුදාව හා බුද්ධි නිලධාරීන් විසින් අවශ්‍ය ආරක්ෂක පියවරයන් හා රථවාහන සැලසුම් ක්‍රියාත්මක කරනු ලබයි. 2026.02.15 දින පැවැත්වීමට නියමිත මෙම තරගයේ ආරක්ෂක රාජකාරී සඳහා පොලිස් නිළධරයින් 2000 ක් පමණ හා 600 කට ආසන්න රථවාහන පාලනය සම්බන්ධයෙන් නිලධාරීන් ප්‍රමාණයක් යොදවා ඇත.

2026.02.15 දින රාත්‍රී 0700 ට ඉන්දු - පකිස්ථාන තරගය ආර්.ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රීඩාංගණයේදී ආරම්භ වීමට නියමිතව ඇත. එබැවින් මෙම ක්‍රීඩාංගණයේ සියලූ දොරටු පැය 1500 ට මහජනතාව සඳහා විවෘත කරනු ලබයි. සියලූම ටිකට් පත් විකිණී අවසන්ව ඇති බව සංවිධායක මණ්ඩලය විසින් දන්වා ඇත. ඒ අනුව ටිකට්පත් හිමි සියළුම ක්‍රීඩාලෝලින්ට ටිකට් පත සමගින් තරගය නැරඹීම සඳහා මෙහිදී අවකාශය සහ අවස්ථාව උදා වේ.

ටිකට් පත් නොමැති මහජනතාව ඉතාමත්ම සාමකාමීව නිවාසයන්හි සිට රූපවාහිනි තිර ඔස්සේ මෙම තරගය නැරඹීය හැකිය. ටිකට් පත් ලබා ගන්නට නොහැකි වූ ක්‍රීඩාලෝලීන් ටිකට් පත් ලබා ගැනීමේ අරමුණින් මෙම ක්‍රීඩාංගනය අවට සැරි සැරිමෙන් වලකින ලෙස දැනුම් දෙනු ලැබේ. විදේශීය සංචාරකයන් මෙන්ම, මෙරට ක්‍රීඩා ලෝලීන් මෙම තරඟය ඉතාමත්ම සංයමයෙන්, සාමකාමීව, එකිනෙකාට ගෞරව දක්වමින්, නැරඹන ලෙස කාරුණිකව ඉල්ලා සිටියි.

**මෙම තරගය නරඹන්නට පැමිණෙන සියළුම ක්‍රීඩාලෝලීන් විසින් ක්‍රීඩාංගනය තුළට ප්ලාස්ටික් හෝ වීදුරු බෝතල් රැගෙන ඒමෙන් වළකින්න. පානීය ජල අවශ්‍යතාව සඳහා ක්‍රීඩාංගණය තුළ සියලුම පහසුකම් සලසා ඇත. තවද, කිසිදු අයෙකු බීමත්ව හෝ කලහකාරී ලෙස හෝ අශෝභන ලෙස හැසිරෙන්නේනම් ඔවුන්ට විරුද්ධව තදින්ම**

**නීතිය ශ්‍රී ලංකා පොලිසිය ක්‍රියාත්මක කරනු ලබන බව ඉතාමත් අවධාරණයෙන් දැනුම් දෙනු ලැබේ.**

ඊට අමතරව විශාල ගමන් මලු, හෙල්මට් / ජැකට්, මත්පැන් හා සංගීත භාණ්ඩ කිසිවක් ක්‍රීඩා භූමිය තුළට රැගෙන ඒමෙන් වළකිය යුතුයි. තවද ඩ්‍රෝන උපකරණ, පිහි වැනි උපකරණ, ඉලෙක්ට්‍රොනික් අයිතමයන්ද ක්‍රීඩා භූමිය තුළට රැගෙන ඒමෙන් වළකිය යුතුයි.

කෙත්තාරාම මාවත හංදියෙන් සහ විල්සන් පෙරේරා මාවතෙන් බ්‍රිට්‍රෝබබා පුල්ලේ හංදියෙන් කිසිදු වාහනයකට ඇතුළත් වන්නට හැකියාව නොමැති අතර ක්‍රිකට් පාලක මණ්ඩලයෙන් නිකුත් කරපු අවසර පත්‍රයක් මත මෙම හන්දි දෙකෙන් ඇතුල් විය හැකි අතර වෙනත් කිසිදු වාහනයකට ඇතුළත් විය නොහැක.

**එමෙන්ම මහජනතාවගේ පහසුව සඳහා රථ ගාල් කිහිපයක් හඳුන්වා දී තිබේ. එනම් ක්‍රීඩාංගණ භූමිය රථගාල, සතොස රථගාල, සෙබෙස්තියන් ඇළ පාර රථගාල, මැට්පාර්ක් රථගාල, කෝවිල පාර රථගාල හා ඇපල්වත්ත රථගාල මෙන්ම අඩි 100 මාර්ගයේ දෙපස ඔබට රථගාල් හැටියට භාවිතා කල හැකි බව කරුණිකව දැනුම් දෙමි.**

**මෙහිදි වින්සන්ට් පෙරේරා මාවත, ග්‍රෑන්ඩ්පාස් පාර, බ්‍රිටෝබබා පුල්ලේ මාර්ගය,** සෙබස්තියන් ඇල පාර මැල්වත්ත පාලම අසලින් ක්‍රීඩංගනය දෙසට ඇතුළු වීම, අඩි 100 පාර, පන්සල පාර හන්දියෙන් ක්‍රීඩාංගනය දෙසට ඇතුළු වීම, මාළිගාවත්ත පටුමග, ක්‍රීඩාංගනය අසලින් අතුරු මාර්ගයෙන් ක්‍රීඩාංගනය දෙසට ඇතුළු වීම, සද්ධර්ම මාවත පන්සල් පාර (බෙත්තාරාම පාර) හන්දියෙන් පන්සල පාරට ඇතුළු මාර්ගයන් වලින් **රථවාහන ගමනාගමනය සීමා කරනු ලබයි.**

සියලු නරඹන්නන් සී.සී.ටීවී දර්ශණ පරික්ෂා කිරීම්, ශරීර පරීක්ෂා කිරීම් හා වාහන සෝදිසි කිරීම් සඳහා නිරන්තරයෙන්ම මෙම තරඟය පටන් ගැනීමට පෙර සිටම ක්‍රියාත්මක වන බැවින් එම නිසාවෙන් ශ්‍රී ලංකා පොලිසියට සහ ආරක්ෂක අංශවලට අවශ්‍ය සියළුම සහාය ලබාදෙන ලෙස මහජනතාව වෙත දන්වා සිටි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**